## මොරටුව විශ්වවිද්‍යාලය – ශ්‍රී ලංකාව

## පුරප්පාඩු

මොරටුව විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. **ශ්‍රව්‍ය දෘශ්‍ය කාර්මික නිලධාරි (11 ශ්‍රේණීය)**

අවශ්‍ය සුදුසුකම් - (I) (අ) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමා සහතිකය හෝ ජාතික ආධුනිකත්ව මණ්ඩලය විසින් 1975 වසරේ සිට පිරිනමන ලද විශේෂ ඉංජිනේරු ආධුනිකත්ව සහතිකය හෝ 1989 වසරේ සිට පිරිනමන ලද ඉංජිනේරු තාක්ෂණිකයින් සඳහා වන ජාතික ඩිප්ලෝමාව හෝ තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව හෝ ඉලෙක්ට්‍රොනික හෝ බලශක්ති ක්ෂේත්‍රය සඳහා සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් ආයතනය විසින් පිරිනමා ඇති අවසාන සහතිකය සහ ශ්‍රව්‍ය දෘශ්‍ය කටයුතු පිළිබඳ එක් වසරක පළපුරුද්ද ලබා තිබීම

හෝ

(ආ) බහු තාක්ෂණික ආයතනයකින් හෝ පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමා ඇති අධ්‍යාපන තාක්ෂණවේදී ඩිප්ලෝමා හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය ශිල්ප ක්‍රමය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම සහ ශ්‍රව්‍ය දෘශ්‍ය කටයුතු පිළිබඳ එක් වසරක පළපුරුද්ද ලබා තිබීම.(ඉහත ඩිප්ලෝමා පාඨමාලාව වසර 02 ක කාලයකට නොඅඩු විය යුතුය.)

හෝ

(ඇ) අ.පො.ස. (උ.පෙළ) විද්‍යා විෂයයන් 03 ක් සමත්වීම සහ වසර 06 ක ශ්‍රව්‍ය දෘශ්‍ය කටයුතු පිළිබඳ පළපුරුද්ද ලබා තිබීම.

වයස : අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් ක්‍රමය - රු. 30380-20x438;6x420;1x525-39665/- U-MN 4 (11)

** මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත දීමනාවන්ද ගෙවනු ලැබේ.

02. **<u>කාර්මික නිලධාරි (11 ශ්‍රේණිය) "අ" බන්ධය</u>**

අවශ්‍ය සුදුසුකම් ජාතික තාක්‍ෂණ ඩිප්ලෝමා සහතිකය (NDT) [ඉලෙක්ට්‍රොනික් හා විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාව/ රසායන හා ක්‍රියාවලි ඉංජිනේරු විද්‍යාව] හෝ ඒ සමාන සුදුසුකම් ලබා තිබීම.

වයස : අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් ක්‍රමය - රු. 25,074-7x253;9x335-29,860/- (මාසික)
U-MT 1(II)

** මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත දීමනාවන්ද ගෙවනු ලැබේ.

03. **<u>විදුලි අධිකාරි II ශ්‍රේණිය</u>**

අවශ්‍ය සුදුසුකම් I (අ) තාක්‍ෂණ විද්‍යා ජාතික ඩිප්ලෝමා සහතික පත්‍රය හෝ ඊට සමාන සුදුසුකම් සහ එම සුදුසුකම් ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රය පිළිබඳව අවුරුදු 04 ක පළපුරුද්ද

**<u>සටහන</u>** තාක්‍ෂණ විද්‍යා ජාතික ඩිප්ලෝමා පාඨමාලාවට අදාල අවුරුදු 4ක පුහුණු කාලසීමාව ඉහත පළපුරුද්දට අදාළ නොවේ.

(ආ) ජාතික තාක්‍ෂණ සහතිකය හෝ ඊට සමාන සුදුසුකම් සහ එම සුදුසුකම් ලබා ගැනීමෙන් <u>පසු</u> අදාළ ක්ෂේත්‍රය පිළිබඳව වසර 10 ක පළපුරුද්ද

වයස : අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

වැටුප් ක්‍රමය : රු. 28,185-6x335;13x438-35,889/-(මාසික) U-MT 1(I)

** මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත දීමනාවන්ද ගෙවනු ලැබේ.

04. **ඖෂධවේදී (පහළ ශ්‍රේණිය)**

**අවශ්‍ය සුදුසුකම්** (I) සුදුසුකම්ලත් ඖෂධවේදියෙකු වශයෙන් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවෙන් පිළිගනු ලබන සහතිකයක් ලබා තිබීම.

වයස : අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් ක්‍රමය : රු.22,571-7x213;10x253-26,592/-(මාසික) U-MT 1(III)

** මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත දීමනාවන්ද ගෙවනු ලැබේ.

05. **හෙදි නිලධාරි II ශ්‍රේණිය**

අවශ්‍ය සුදුසුකම් (I) දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 03 කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් විය යුතුය.

(II) ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් පිළිගනු ලබන හෙදි සහතිකයක් ලබාතිබීම.

වයස : අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් ක්‍රමය : රු.22,571-7x213;10x253-26,592/-(මාසික) U-MT 1(III)

** මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත දීමනාවන්ද ගෙවනු ලැබේ.

06. **පෑස්සුම්කරු II ශ්‍රේණිය**

අවශ්‍ය සුදුසුකම් (I) කියවීමට හා ලිවීමට හැකියාව

(II) පහත සඳහන් කරුණු පිළිබඳව දැනීම.

(අ) අඟලෙන් 1/32 දක්වා පරිමාණයෙන් කියවීම සහ මයික්‍රොමීටර් සෙට් කිරීම, සරල ඇඳීම් කියවා තේරුම් ගැනීම, නොයෙකුත් වැඩ පෑස්සීම් සඳහා පිළියෙල කිරීමේ ක්‍රමය, හේත්තු, අතිවැස්ම, පිරිපට් මුලුපිළියෙල කර නිම කිරීම හා වෙනත් අන්දමේ පෑස්සීම්.

(ආ) ද්‍රව්‍යවල නොයෙකුත් කොටස්වලදී යෙදු ගන්නා ඉලෙක්ට්‍රෝඩ සහ නොයෙකුත් සයිස් වර්ගවල විදුලිබල තිරස්, සිරස් සහ උඩින් පෑස්සීම.

(ඇ) කිලිප කොට සිනිඳු නිමවුමක් ලැබෙන ලෙස පිරවීම ඇසිටිලීන්, ජනක පිරිය තලවල සුළු දෝෂයන් සොයාගෙන ඒවා හරිගැස්වීම, පිරියතලවල හෝ ගෑස් සිලින්ඩර් ඇඳීමේ නිවැරදි ක්‍රම.

(III) රජයේ දෙපාර්තමේන්තුවක පිළිගත් ඉංජිනේරු ආයතනයක පැස්සුම්කරුවෙකු වශයෙන් අවුරුදු 02කට නො අඩු පළපුරුද්දක් තිබිය යුතුය.

වයස : අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් ක්‍රමය : රු.21,356-16x192-24,428/-(මාසික) U-PL 3(III)

** මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත දීමනාවන්ද ගෙවනු ලැබේ.

## 07. ඉලෙක්ට්‍රොනික් උපකරණ අළුත්වැඩියා කරන්නා 11 ශ්‍රේණිය

අවශ්‍ය සුදුසුකම්:-

(I) කියවීමේ හා ලිවීමේ හැකියවන් තිබිය යුතුය.

(II) (අ) සුළුසැරි සටහන් (Simple circuit diagrams) හා විදුලි කම්බි සටහන් කියවීමට හා තේරුම් ගැනීමට හැකියවක් තිබිය යුතුය.

(ආ) සංඥා ජනක (Signal Generatores) බහුමානක (Multimeters) කැතෝඩ් කිරණ ඔසිලෙස්කොප්ස් (cathode ray Oscilopes) යනාදී ඉලොක්ට්‍රොනික් උපකරණ අළුත්වැඩියා කිරීම සඳහා නිතර භාවිතා කරන අත්හදා බැලීමේ උපකරණ පාවිච්චි කිරීම ගැන හැකියවක් තිබිය යුතුයි.

(ඇ) දී ඇති සැරිසටහන් අනුව පැහැදිලිව සැලසුම් කර රයම් වලින් පෑස්සුම් කර ඉලෙක්ට්‍රොනික් සැරි සකස් කිරීමේ හැකියවක් තිබිය යුතුයි.

(III) ඉහත අදාල වැඩ ගැන අවුරුදු 02 කට නො අඩු පළපුරුද්දක් තිබිය යුතුය.

සටහන- 07 වැනි ප්‍රමාණය සමත් වී ඇති අයවලුන කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

වයස : අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් ක්‍රමය : රු.21,356-16x192-24,428/-(මාසික) U-PL 3(III)

** මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත දීමනාවන්ද ගෙවනු ලැබේ.

08. විදුලි කාර්මික II ශ්‍රේණිය

අවශ්‍ය සුදුසුකම් (I) කියවීමට හා ලිවීමට හැකියාව

(II) පහත සඳහන් කරුණු පිළිබඳ දැනීම

(අ) දෝෂයන් සොයා ගැනීම, ද්‍රව්‍ය අළුත්වැඩියා කිරීම සහ නැවත සවි කිරීම, ට්‍රාන්ස්ෆෝමර් සහ සියළුම වර්ගවල යන්ත්‍රසූත්‍ර සහ උපකරණ කේබල්, වයර් කම්බි සහ ඒවා වර්ග කිරීම, මිනුම් උපකරණ හා ඒවායේ භාවිතය, වයර් කම්බි ඇදීමේ විවිධ ක්‍රම, බද්ධ කිරීම, මීටර් හා කුඩා ට්‍රාන්ස්ෆෝමර් පරීක්ෂා කිරීම.

(ආ) ඇඳීමේ සහ රූප සටහන් කියවා තේරුම් ගැනීම, පරිමාණයන් කියවීම සහ භාග වලින් මාන සටහන් තැබීම.

(ඇ) මෙම කාර්යයන්හිදී භාවිතා කරනු ලබන ආවුදවල ආරක්ෂාව සහ ඒවා පාවිච්චි කිරීම පිළිබඳ දැනුම තිබිය යුතුය.

(III) රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ආයතනයක විදුලි කාර්මිකයෙකු වශයෙන් අවුරුදු දෙකකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

වයස : අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් ක්‍රමය : රු.21,356-16x192-24,428/-(මාසික) U-PL 3(III)

** මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත දීමනාවන්ද ගෙවනු ලැබේ.

09. පෙදරේරු 11 ශ්‍රේණිය

අවශ්‍ය සුදුසුකම් (I) කියවීමට හා ලිවීමට හැකියාව තිබීම

(II) පහත සඳහන් කරුණු පිළිබඳ දැනීම

(අ) බිත්ති පාදම් කිරීමේ උපයෝගී කරගනු ලබන ඒ ඒ පතයන්, බිත්ති ආරුක්කු, කේතුමය කනු, දුම් කවුළු, කසල කානු කුහර ආදියෙහි උපයෝගී කරගනු ලබන නොයෙකුත් ආකාරයේ ගඩොල් වැඩ.

(ආ) සියළුම අන්දමේ බදාමයන් ශක්තිමත් කරන ලද කොන්ක්‍රීට් මිශ්‍ර කිරීම හා දැමීම.

(ඇ) සැලසුම් කියවීම හා සරල අන්දමේ ඉදිකිරීම් සඳහා අත්තිවාරම් දැමීම ආදිය පිළිබඳ දැනුමක් තිබීම.

(ඈ) ඉමල්ෂන් තීන්ත භාවිතයෙන් පින්තාරු කිරීමේ හැකියාව.

(III) පෙදරේරු කර්මාන්ත පිළිබඳ අවුරුදු 02 කට නොඅඩු පළපුරුද්දක් .තිබිය යුතුයි.

සටහන විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ කම්කරුවකු පුහුණු තනතුරක රාජකාරි ඉටු කිරීමට සහාය වීමෙන් ලබාගෙන ඇති පළපුරුද්ද, ඉහත සඳහන් කර ඇති පළපුරුද්දට සමාන ලෙස පිළිගනු ලැබේ.

වයස : අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් ක්‍රමය : රු.21,356-16x192-24,428/-(මාසික) U-PL 3(III)

** මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත දීමනාවන්ද ගෙවනු ලැබේ.

10. <u>ජලනල කාර්මික 11 ශ්‍රේණිය</u>

අවශ්‍ය සුදුසුකම් - (I) කියවීමට හා ලිවීමට හැකියාව

(II) පහත සඳහන් කරුණු පිළිබඳ දැනීම

(අ) 1/64 දක්වා පරිමාණයන් කියවීම සහ තත්කාලීන ආයුධ පාවිච්චිය හා නඩත්තු පිළිබඳ දැනුම.

(ආ) චීනච්චට්ටි(සී.අයි) ගැල්වනයිස් පයිප්ප (ජී.අයි) සහ වාෂ්පීකරණ පයිප්ප (ලෙඩ්) ඇතුළු විවිධ පිරිවැද්දුම් හා ඒවා පරීක්ෂා කිරීම.

(ඇ) බෝල් වැල්ව, ජල භාජන ආදිය අළුත් වැඩියා කිරීම සහ සරල ඇඳීම් තේරුම් ගැනීමේ හා කියවීමේ හැකියාව.

(III) ජලනල කර්මාන්තය පිළිබඳව අවුරුදු දෙකකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

සටහන 07 වැනි ප්‍රමාණය සමත් වුවන් කෙරෙහි විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.

වයස : අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් ක්‍රමය : රු.21,356-16x192-24,428/-(මාසික) U-PL 3(III)

** මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත දීමනාවන්ද ගෙවනු ලැබේ.

11. **<u>උද්‍යාන සේවක (II ශ්‍රේණිය)</u>**

අවශ්‍ය සුදුසුකම් - (I) කියවීමට හා ලිවීමට හැකියාව

(II) පේරාදෙණියේ රාජකීය උද්භිද උද්‍යානය හා හග්ගල හෝ ගම්පහ උද්භිද උද්‍යානය වැනි උයන් වතු වැවීමේ විද්‍යාව ඉගැන්වෙන ආයතනයක සේවය කිරීමෙන් ලත් වසර 02 ක පළපුරුද්දක් තිබීම.

වයස : අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් ක්‍රමය : රු.19,300-15x178-21,970/-(මාසික) (U-PL 1(III)

** මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත දීමනාවන්ද ගෙවනු ලැබේ.

සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2017.07.24 වන දින හෝ ඊට පෙර ලැබෙනසේ මෙම විශ්වවිද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරි/ආයතන (අනධ්‍යයන) වෙත ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

තවද මේ සඳහා අදාළ ආදර්ශ අයදුම්පත්‍රය මෙම විශ්වවිද්‍යාලයේ ආයතන (අනධ්‍යයන) අංශයේ, සහකාර ලේඛකාධිකාරි නමට ලිපිනය ලියූ රු. 40.00 ක මුද්දර ඇලවූ 25.5 සෙ.මී.x 10 සෙ.මී. ප්‍රමාණයේ ලිපි කවරයක් එවීමෙන් හෝ පැමිණ හෝ මොරටුව විශ්වවිද්‍යාලයේ www.mrt.ac.lk. වෙබ් අඩවිය මඟින් ලබාගත හැකිය.

උසස් අධ්‍යාපන ආයතනයන්හී, රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් එවීමට කටයුතු කළයුතු වේ.

**ප්‍රමාද වී ලැබෙන, අවශ්‍ය විස්තර සඳහන් නොකළ, අපැහැදිලි හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොමැති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එසේ අයදුම්පත් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා වුවද එම අයදුම්පත නැවත සැළකිල්ලට භාජනය කරනු නොලැබේ.**

මෙම තනතුරු ලිඛිත/ප්‍රායෝගික/වෘත්තීය හා සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතාවය පදනම් කරගෙන සුදුස්සන් බඳවාගනු ලැබේ.

වැඩ බලන ලේඛකාධිකාරි,
මොරටුව විශ්වවිද්‍යාලය,
මොරටුව.

2017.07.04